ජාතික ඔලිම්පික් කමිටුවේ ලිංගික හිංසාවන් පිළිබඳ පැමිණිලි කමිටුව (පැ.ක.)

## රාජකාරි ක්‍රියා කරන ක්‍රමය

## පෙරවදන

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ (ශ්‍රී.ලං.ජා.ඔ.ක.) ලිංගික හිංසාවටට එරෙහි පැමිණිලි කමිටුව (පැ.ක.) විසින් සියලුම පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින්, බරපතළ ලෙස සලකා, සංවේදීව හා රහසිගත ලෙස කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

පැමිණිලි කමිටුව විසින් පැමිණිල්ලට සම්බන්ධ පුද්ගලයන් වින්දිතයන් නොවීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය. පැමිණිල්ලක් ඉදිරිපත් කරන පුද්ගලයකුට හෝ වෙනත් පුද්ගලයෙකුගේ පැමිණිල්ලකට සහය දක්වන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව හිංසා හා ගොදුරු කරන ඕනෑම පුද්ගලයෙකුට විනය ක්‍රියාමාර්ග පැනවිය හැකිය.

මෙම රාජකාරි ක්‍රියා කරන ක්‍රමය, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ලිංගික අපයෝජනය හා හිංසාව සම්බන්ධ ප්‍රතිපත්තියට පහසුකම් සපයන්නක් මෙන්ම අතිරේකයක් ද විය යුතුය. යම් අනනුකූලතාවයකදී ප්‍රතිපත්තියේ ප්‍රතිපාදන බල පැවැත්විය යුතුය.

## පැමිණිලි කමිටුවේ ක්‍රියාකාරීත්වය, කාර්යභාරය හා බලතලවල විෂය පථය

1. කාලය /කාල පරාසය

   (a) පැමිණිලි කමිටුව සඳහා වසර 5ක් (2019 සැප්තැම්බර් - 2024 අගෝස්තු)
   (b) මාරුවන සභාපති- සෑම වසර දෙකහමාරකටම (2.5) වරක්

2. පැමිණිලි කමිටුවේ වැදගත් ලක්ෂණ සහ පවතින සම්පත් සංචිතය

| | |
|---|---|
| **නීති උපදෙස්** | ශ්‍යාමලා ගෝමස්, සබ්‍රිනා යූසුෆ්අලි |
| **මාධ්‍ය වැඩමුළු** | දිලායි ජෝසෆ්, නෙඩ්රා වික්‍රමසිංහ |
| **ප්‍රකාශකයන්** | නිලූ ජයතිලක, නෙඩ්රා වික්‍රමසිංහ, කැරිල් ටොසර් - පෙරේරා, ජයන්ති කුරු-උතුම්පලා, ශරනායා සේකරම් |
| **මනෝ සමාජීය උපකාර** | ඩියඩ්රි මොරායස්, දොස්තර නිහාල් ද සිල්වා, ශරනායා සේකරම් |
| **ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥයන්** | ශරනායා සේකරම්, ශ්‍යාමාලා ගෝමස්, ජයන්ති කුරු-උතුම්පලා |

3. ප්‍රධානව සම්බන්ධ කරගත යුත්තේ කවුද?

   - ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය හා පැමිණිලි කමිටුව අතර - සභාපති හෝ සභාපති විසින් නම් කරන ලද පැමිණිලි කමිටුවේ සාමාජිකයෙක්
   - අන්තර්ජාල පැමිණිලි පෝරම මගින් ලැබෙන සියලු පැමිණිලි භාර ගැනීම සඳහා ගූගල් විද්‍යුත් තැපැල් ලිපිනයක් ස්ථාපනය කෙරෙනු ඇත.
     (උදාහරණ: NOCSHComplaints@gmail.com)

4. පැමිණිල්ලක් සිදු කළ හැක්කේ කෙසේද?

- ශ්‍රී ලංකා ඔලිම්පික් කවුන්සිලයේ ලිංගික හිංසා පැමිණිලි කමිටුවේ ලිපිනය අමතා මුද්‍රා තබන ලද ලිපි කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් සබැඳිය හරහා ගොනු කිරීම මගින් පැමිණිල්ලක් ගොනු කළ හැක.

- ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ යන භාෂාවලින් පැමිණිල්ලක් ගොනු කළ හැක.

5. පැමිණිල්ලක් ගොනු කළ විට සිදු වන්නේ කුමක්ද?

   - ලැබෙන එක් එක් පැමිණිල්ලට පහත පැහැදිලි කර ඇති පරිදි ස්ථර 2ක ක්‍රියාදාමයක් සිදුකළ යුතුය.

**A. පැමිණිලි කමිටුව (පැ. ක.)**

ගොනුකරන ලද සියලු පැමිණිලි විමර්ශනය කර විභාග කමිටුවට (Hearing Committee) සොයාගැනීම් ඉදිරිපත් කිරීම.

**B. විභාග කමිටුව (වි.ක.)**

පැමිණිලි කමිටුව සොයා ගන්නා ලද සොයාගැනීම්වලින් සම්පාදනය කරන ලද දේ විමර්ශනය කිරීමට සහ විභාග කමිටුව සොයා ගන්නා ලද සොයාගැනීම්වලින් සහ නිර්දේශිත සම්බාධක වෙතොත් ඒවාද අඩංගුකර වාර්තාවක් සකස් කිරීමටත් ඒවා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය වෙත අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

6. භූගෝලීය ප්‍රවේශය

   a. නඩු කොළඹින් පිටත පිහිටා ඇතිවිට, පැමිණිලිකරු පසුවිපරම් විභාගය සඳහා කොළඹට ගමන් කිරීම අවශ්‍ය වේ.
   b. පැමිණිලි කමිටුව විසින් චූදිත පාර්ශවය වෙත (ලියා පදිංචි තැපැල මගින්) විභාගය සඳහා පෙනී සිටීම සඳහා ලිඛිත නිර්දේශයක් ද යවනු ඇත.

7. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ වරමට එහා ගිය පැමිණිලි

   පැමිණිලිකරුගේ කැමැත්ත ලබාගෙන, ඔලිම්පික් සම්මේලනයේ නොවන මලල ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, වෙනත් සේවකයන් සම්බන්ධ පැමිණිලි, චූදිත පාර්ශවයේ ජාතික ක්‍රීඩා සම්මේලනය වෙත ඉදිරිපත් කළ යුතුය.

8. දැනුවත් කිරීම්

   මාධ්‍ය ව්‍යාපාර සහිතව හෝ රහිතව පැමිණිලි කමිටුව විසින් සිය මෙහෙයවීමෙන් දැනුවත් කිරීම් සහ/හෝ ඇමතීම් සහ /හෝ උපදේශන සියලු දෙනාම සමග හෝ ඕනෑම ජාතික ක්‍රීඩා සම්මේලනයක් සමඟ සිදු කළ හැක.

9. උපදේශනය

   පැමිණිලි කමිටුව මගින් ඕනෑම බලපෑමට ලක්වූ පාර්ශවයක් උපදේශන සේවා සඳහා සහ /හෝ මානසික සහය සඳහා නිර්දේශ කිරීම හෝ යොමු කිරීම සිදු කළ හැක.

**පැමිණිලි කමිටුව (පැ.ක.)**

1. ත්‍රයිභාෂාමය ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ වෙබ් අඩවියෙන්ලබාගත හැකි පැමිණිලි පෝරමය හරහා අන්තර්ජාලය මාර්ගයෙන් පැමිණිල්ලක් ගොනු කිරීම සිදු කරයි.

2. පැමිණිලි කමිටුව විසින් පමණක් ළඟාවියහැකි ගූගල් විද්‍යුත් තැපැල් ලිපිනයක් විද්‍යුත් මාර්ගයෙන් පැමිණිලි භාරගැනීම සඳහා නිර්මාණය කෙරෙනු ඇත. (රහස්‍ය භාවය පවත්වා ගෙන යෑම සඳහා)

3. සභාපතිවරයා විසින් මීළඟට පැමිණිලි කමිටුවේ සාමාජිකයන්ට සහ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය වෙත පැමිණිල්ලක් ලැබී ඇති බව දැනුම් දෙනු ඇත.

4. පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය භාරගන්නේ කවරෙක්ද යන්න සාකච්ඡා කිරීමට පැමිණිලි කමිටුව දින තුනක් ඇතුළත භෞතිකව/ අන්තර්ජාලය මාර්ගයෙන් හමු වනු ඇත.

5. නඩුවක් භාර ගැනීම සඳහා පැමිණිලි කමිටුවෙහි දෙදෙනෙක් නම් කිරීම.

6. විභාගය, ජාතික ඔලිම්පික් කවුන්සිලයේ ඔලිම්පික් නිවසේ හෝ එක් එක් නඩුවට ආනුශංගික විශේෂිත කරුණු හා තත්ත්වයන් පදනම් කොටගෙන පැමිණිලි කමිටුව සුදුසු යැයි හැඟෙන වෙනත් ස්ථානයක පැවැත්විය හැකිය.

7. නඩුව පටිගත කිරීම සඳහා පැමිණිලි කමිටුවට විද්‍යුත් රෙකෝඩන භාවිතා කළ හැක.

8. සවිස්තරාත්මක පැමිණිලි පෝරමයක් (ඉලෙක්ට්‍රොනික පිටපතක්) ස්ථාවර සහ ක්‍රමාණුකූල ආකාරයකට සියලු විස්තර සඳහන් කිරීම සඳහා පැමිණිලි කමිටුව විසින් නිර්මාණය කෙරෙනු ඇත. මෙමගින් සියලුම නඩු ඒකාකාරී ආකාරයකට ලේඛනගත කිරීම තහවුරු වනු ඇත.

9. ඉලෙක්ට්‍රොනික ලිපිගොනුව විභාග කමිටුව වෙත පැමිණිල්ල ලද දිනයේ සිට දින 30ක් ඇතුළත හෝ ගැටළුවේ සංකීර්ණභාවය මත පදනම්ව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ මහලේකම් (Secretary Genaral) අවසර දෙන ලද වෙනත් දිගු කාලයක දී නිර්මාණය කර භාර දිය යුතුය.

**විභාග කමිටුව (වි. ක.)**

1. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ විභාග කමිටුවේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වනු ඇති අතර පහත අයවලුන් අන්තර්ගත වනු ඇත.

   a. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ සභාපති (President) හෝ මහ ලේකම් ( නිල බලයෙන්)
   b. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ කාන්තා කමිටුවේ සභාපතිනිය
   c. ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් විසින් නිසි ලෙස අවසරලත් නිලධාරියෙක්
   d. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් නම් කරන ලද නීතිඥවරයෙක්
   e. වූදිත පාර්ශවයේ ජාතික ක්‍රීඩා සම්මේලනයේ තේරී පත්වන ලද නියෝජිතයෙක්
   f. නඩුවට මේ දක්වා සම්බන්ධ නොවූ පැමිණිලි කමිටුවේ නියෝජිතයන් දෙදෙනෙක්

2. විනය සම්බාධක

පැමිණිලි කමිටුවට පැමිණිල්ල ලැබී දින 21 ක් ඇතුලත පැමිණිල්ල පිළිබඳ විස්තරයක් සහ අදාළ සියලු කරුණු හා තත්ත්වයන්, අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය, අදාල නීති, අදාල වන ප්‍රතිපත්තීන්, සොයාගැනීම්, සහ නිර්දේශිත සම්බාධක වෙතොත් ඒවා ද ඇතුලත් නිර්දේශයන් අනාවරණය කරනු ලබන සවිස්තරාත්මක වාර්තාවක් විභාග කමිටුව විසින් පිළියෙළ කළ යුතුය. එවැනි වාර්තාවක් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය වෙත පැමිණිලිකාර පාර්ශවය හා වූදිත පාර්ශවයටද එහි පිටපත් සමගින් භාර දිය යුතුය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් විභාග කමිටුවේ නිර්දේශයන්ද සලකා බලා දින 14 ක් ඇතුළත පියවර ගත යුතුය. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් එවැනි ක්‍රියාවක් පූර්ණ ලෙස බලාත්මක කිරීම අවශ්‍ය හෝ කඩිනම් යැයි සලකන විටක ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් වූදිත පාර්ශවයට එරෙහිව වූදිත පාර්ශවයේ අදාල ජාතික ක්‍රීඩා සම්මේලනය හරහා යොමු කිරීම සහ එවැනි ක්‍රියාමාර්ගයක් පැනවීම සිදුකළ හැකිය.

ප්‍රායෝගික වනතාක් දුරට ඕනෑම පැමිණිලිකරුවෙකුට සහ/ හෝ ඕනෑම සම්මේලනයකට විරුද්ධ එවැනි නිර්දේශිත සම්බාධකයන් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයේ ලිංගික අපයෝජන හා හිංසා පිලිබඳ ප්‍රතිපත්තිය කඩ කළ බවට අනාවරණය වන විටක:

a. ඕනෑම සේවක හා ගිවිසුම් රීති හා අවශ්‍යතා වලට අනුකූලව අදාළ කරගත යුතුය;
b. සාධාරණ හා යුක්ති සහගත විය යුතුය;
c. සාක්ෂි, ඉදිරිපත් වූ තොරතුරු සහ කඩකිරීමේ බරපතළ භාවය මත පදනම් විය යුතු අතර;
d. අපගේ අත්‍යවශ්‍ය ලේඛන, අනු නීති, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය සහ ජාත්‍යන්තර ඔලිම්පික් කවුන්සිලයේ ප්‍රතිපත්ති මගින් සළකා බැලිය යුතුය.

පැමිණිලිකරුවන්ට එරෙහිව පැනවිය හැකි සම්බාධකවලට පහත දැක්වෙන දේ අන්තර්ගත විය හැකිය:

(a) පුද්ගලයා විසින් වාචික සහ/ හෝ ලිඛිත සමාව අයැදීමක් සඳහා නිර්දේශ;
(b) හැසිරීම අමතා පුද්ගලයාට උපදේශනය සැපයීම;
(c) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය මගින් නීත්‍යනුකූල අවසරය ලද හෝ පවත්වන ලද ඕනෑම තරඟ, ක්‍රියාකාරකම් හෝ ඉසව්වලින් ප්‍රදානය කරන ලද සියලුම/ ඕනෑම සම්මාන, ස්ථාන, වාර්තා, ජයග්‍රහණ ආපසු ලබා ගැනීම;
(d) ලිඛිත අවවාද නිකුත් කිරීම;
(e) සාමාජිකත්වය, තනතුරක හෝ ක්‍රියාකාරකමක සහභාගිත්වය හෝ නිරත වීම අත්හිටුවීම හෝ අවසන් කිරීම;
(f) ස්ථිර ලෙස හෝ යම්කිසි කාල වකවානුවකට ප්‍රතීතන ලියාපදිංචිය අවලංගු කිරීම;
(g) දඩ නියම කිරීම හෝ;
(h) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් සාධාරණ හා සුදුසු යැයි සලකන වෙනත් ආකාරයක විනය ක්‍රියාමාර්ගයක්.

එවැනි චූදිත පාර්ශවයේ ජාතික ක්‍රීඩා සම්මේලනය දක්වා දිවෙන විනය සම්බාධක ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් පනවන ලද විටක එම සම්බාධකවල අඩංගු විය හැක්කේ:

(a) ලිඛිත අවවාදයක්;
(b) දඩයක්;
(c) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය මගින් එම සම්මේලනය වෙත ලබාදී ඇති ඕනෑම අයිතිවාසිකමක්, වරප්‍රසාද, ප්‍රතිලාභ නියමිත කාලයකට අත්හිටුවීම සඳහා විධානයක්;
(d) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය මගින් එයට ලබාදී ඇති හෝ ප්‍රදානය කරන ලද ඕනෑම ආධාරයක් නියමිත දිනයක සිට නවතා දැමීම සඳහා විධානයක්;
(e) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය මගින් එම සංවිධානය මගින් හෝ එහි අනුග්‍රහය යටතේ පවත්වන ලද සිද්ධීන් නවතා දැමීමට විධානයක්;
(f) අදාළ සම්මේලනයේ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලය සමග වූ සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අවසන් කිරීමට නිර්දේශයක්;
(g) ජාතික ඔලිම්පික් කවුන්සිලය විසින් සාධාරණ හා සුදුසු යැයි සලකන වෙනත් ඕනෑම ආකාරයක විනය ක්‍රියාමාර්ගයක්.

3. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කවුන්සිලයට විනය සම්බාධක නිර්දේශ කිරීමේ දී විභාග කමිටුව සලකා බැලිය යුත්තේ:

a. කඩකිරීමේ ස්වභාවය හා බරපතළභාවය;
b. චූදිත පාර්ශවය විසින් හැසිරීම ප්‍රතිපත්තිය කඩ කිරීමක් බව දැන සිටියේද හෝ දැන සිටිය යුතු වූයේ ද යන වග;
c. චූදිත පාර්ශවයේ වින්දනයේ මට්ටම;
d. පුද්ගලික, වෘත්තීය හෝ මූල්‍ය තත්ත්වයන් ඇතුළත්ව චූදිත පාර්ශවය වෙත යෝජිත විනය ක්‍රියාමාර්ග වල බලපෑම;
e. චූදිත පාර්ශවය වෙත නියම කරන ලද මෙවැනි සමාන සිදුවීම් වලින් පැන නගින ලද විනය ක්‍රියාමාර්ග හෝ අදාළ මීට ඉහත අවවාද කිසිවක් වේද;
f. වෙනත් දඬුවම් අවම කිරීමේ තත්වයන්.